පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

සෞඛ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඇඟුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

*பாராளுமன்ற வெளியீட்டு தொடர் இல* - 492

சுகாதார அமைச்சு

*பாராளுமன்ற அரச கணக்குகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்*

Parliamentary Series Number – 492

Ministry of Health

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - **492**
ආයතනයේ නම - සෞඛ්‍ය අමාත්‍යාංශය

පළමු කොටස - **91.00**

| | කාර්යසාධන ඇගයීම ප්‍රකාරව කාරක සභාව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා | දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | 2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබීම | සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් සම්බන්ධ ගෙවීම් සිදු කිරීමේදී ඒ සෑම අවස්ථාවකදීම එම වත්කම් ප්‍රාග්ධනිත කිරීම සිදු වේ. එමෙන්ම තවදුරටත් පවතින ස්ථාවර වත්කම් සිගාස් වැඩසටහනේ ප්‍රාග්ධනිත කිරීම් සිදු කරමින් පවතී. |
| 02 | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම | හානි පාඩු සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කර අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. (පොදු චක්‍රලේඛ අංක 01-39/2022 හා 2022.11.30)<br>තවද හානි පාඩු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම පිළිබඳව ද අවශ්‍ය උපදෙස් ලබා දීමද සිදුකරමින් පවතී. |
| 03 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබීම | 2023.03.22 දින 2023-2025 අදාළ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ මෘදු පිටපත රජයේ විගණන කාර්යාලයට පිටපතක් ද සහිතව, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.<br>තවද, 2023.05.02 වන දින මෙම සැලැස්මේ මෘදු පිටපත නැවත වරක් ඉහත දක්වා ඇති ආයතන වෙත යොමුකර ඇත.<br>එමෙන්ම ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලයට සකස් කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. |
| 04 | විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම. | විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සඳහා අදාළවන රෝහල්වලින් හා එක් එක් අංශයන් මඟින් තොරතුරු කැඳවා පිළිතුරු සකස් කරනු ලබන අතර, ඒ සඳහා යම් කාලයක් ගතවේ.<br>තවද විගණන විමසුම්වලට අදාළ වකවානුව තුළ පිළිතුරු සැපයීමේ වැදගත්කම සම්බන්ධයෙන් එක් එක් අංශ සහ රෝහල් වරින් වර දැනුවත් කරනු ලබයි. පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදෙන ලෙස සිහිකැඳවීම් ලිපි යවා ඇති අතර, මේ වනවිට විගණන විමසුම් සඳහා පිළිතුරු ලැබෙමින් පවතී. |
| 05 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම | මේ වන විට බොහෝ ආයතන වෙතින් මසක් තුළ පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලබයි. |
| 06 | 2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම. | මේ පිළිබඳව නිලධාරීන් දැනුවත්කර ඉදිරියේදී වත්කම් තොරතුරු නිවැරදිව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| 07 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීමට අදාළව චක්‍රලේඛ මඟින් උපදෙස් හා නියමිත කාලරාමු ලබා දී ඇත. (පොදු චක්‍රලේඛ අංක 01-41/2025 හා 2025.11.16)<br>ඒ අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලදී අතිරික්ත, ඌණතා පිළිබඳ අනාවරණය වීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම ද සිදු වේ. නියමිත කාලය තුළ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නැවතත් සියලු ආයතන වෙත උපදෙස් ලබා දීම සිදු කරනු ලැබේ. |
| 08 | සියලුම වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැති වීම, සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම. වාහනයක් ගර්හිත වී මාස 08 ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම, රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම | i. ලියාපදිංචි සහතික නොමැති වාහන සඳහා ලියාපදිංචි සහතික ලබා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය වෙත යොමුකළ අතර, ඒ සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙත පැමිණිලි කර එම පැමිණිල්ලේ පිටපතක් සමඟ ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි. ඒ අනුව, 2025.08.27 හා 2025.11.27 දිනැතිව මරදාන පොලිස් ස්ථානාධිපති වෙත ලිපි යොමු කරන ලදි. එහෙත් එම කාර්යය ඉටු නොවුන බැවින් පැමිණිල්ලක් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස 2026.05.08 දිනැතිව පොලිස්පති වෙත ලිපියක් යොමුකර ඇත.<br><br>ii. අමාත්‍යාංශයේ සංචිත වාහනවල රාජ්‍ය ලාංඡන යෙදීම සඳහා ස්ටිකර් මුද්‍රණය කරන ලද අතර, වාහන 66 ක රාජ්‍ය ලාංඡන ඇලවීම සිදු කරන ලදි.<br>තව ද සංචිත වාහනවල ස්ටිකර් පවතින්නේ ද යන්න සම්බන්ධයෙන් ප්‍රවාහන අංශයේ නිලධාරීන් යොදවා නැවත පරීක්ෂා කළ අතර, මීට පෙර ස්ටිකර් අලවන ලද වාහනවල ද ස්ටිකර් දූර්වර්ණ වී ඇති බවත්, සමහර වාහනවල ස්ටිකර් ගැලවී ඇති බවත් වාර්තා කරන ලදි. ඒ අනුව සියලුම සංචිත වාහනවල ස්ටිකර් ඇලවීම සඳහා අවශ්‍ය ස්ටිකර් 300ක් මුද්‍රණය කිරීමේ කටයුතු ද සිදුකරමින් පවතී.<br><br>iii. ගර්හිත තත්වයට පත්ව තිබූ සියලු වාහන 2025.08.06 දින වෙන්දේසි කරන ලදි.<br>වාහනයක් ගර්හිත තත්වයට පත්ව ඇති බව හඳුනාගත් පසු එම වාහන අපහරණය කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබේ.<br><br>iv. අනතුරක් සිදු වූ බව දැන් වූ වහාම මු.රෙ. 104 කමිටුවක් පත්කර , එම කමිටු නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. වාහන අනතුරු සම්බන්ධයෙන් හානිපාඩු ලේඛනයක් යාවත්කාලීව කරමින් පවත්වාගෙන යනු ලැබේ.<br>එමෙන්ම වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව නිසි පරිදි කටයුතු කරනු ලැබේ. |
| 09 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබීම. | එම බැංකු ගිණුම හඳුනාගෙන වසා දැමීම සඳහා කටයුතු කර ඇත. දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පැවති බැංකු ගිණුම වසා දමා ඇත. ඉතා මෑත කාලීනව අක්‍රිය වූ බැංකු ගිණුම් ද වසා දැමීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| 10 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබීම. | එවැනි ගැලපුම් කළ යුතුව තිබූ සියලුම ශේෂ මේ වනවිට නිරවුල්කර ඇත.<br>තවද විමධ්‍යගත රෝහල් හා ආයතන විසින් යොමු කරනු ලබන බැංකු සැසඳුම් ප්‍රකාශ පදනම් කර ගනිමින් සකස් කළ සමාලෝචිත වර්ෂයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයෙන් හඳුනාගත්, මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතුව තිබූ ගැලපුම් සිදු කර ඇත.<br>සමාලෝචිත වර්ෂයට අදාළව සියලු ගැලපීම් සිදුකර අවසන් බව වර්තමාන බැංකු සැසඳුම් ප්‍රකාශ මඟින් අනාවරණය වේ. |
| 11 | මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබීම. | සියලු රෝහල් හා සෞඛ්‍ය ආයතන විසින් ITMIS පද්ධතිය හරහා ගිණුම් කටයුතු සිදු කිරීම ආරම්භ කිරීමත් සමඟ ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් සඳහා එළඹීමේ හැකියාවක් නොමැත.<br>ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීමේ අවස්ථාව අහුරා ඇති බැවින් හා සියලු සුදුසුකම් සම්පූර්ණ කළ වවුවර්පත් පමණක් ITMIS පද්ධතියට ඇතුළත් කළ පසු මහා භාණ්ඩාගාරය විසින් අක් මුදල් නිදහස් කරනු ලබන බැවින් මෙම තත්වය සමනය වී ඇත. මේ සම්බන්ධයෙන් රෝහල් හා සියලු ආයතන දැනුවත් කර ඇත. |
| 12 | නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර තිබීම. | මේ වන විට නියමිත පරිදි ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. |
| 13 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන ගිහ ණය ශේෂ පැවතීම | ණය ලබාගත් වර්තමානයේ සේවයේ නියුතු සියලු නිලධාරීන්ගේ නම, තනතුර, ලිපිනය, හැඳුනුම්පත් අංකය, වැටුප් අංකය, ඇපකරුවන්ගේ සියලු තොරතුරු ඇතුලු අනන්‍යතාවය හා ණය ශේෂයන්ගේ විස්තර තහවුරු කර ගත හැකි සියලු තොරතුරු ගොනුවක් ගිණුම් අංශය තුළ පවත්වාගත යුතු බවට උපදෙස් ලබා දී ඇත. එමඟින් ඉදිරියේදී ඇති වන තොරතුරු හිඟකම අවම මට්ටමකට ළඟා වේ.<br><br>ණය ලබාගත් නිලධාරීන්ගේ කේවල ණය ශේෂයන් Payroll හි විස්තර සමඟ සෑම මසකම තුලනය කල යුතු බවත් ගිණුම් පොත් තුළ ලැබීම් ගෙවීම් සියල්ල සෑම මසක් පාසාම යාවත්කාලීන කළ යුතු බවත් උපදෙස් ලබා දී ඇත.<br><br>අභ්‍යන්තර ස්ථාන මාරු ගිය සහ පැමිණි නිලධාරීන්ගේ 2020 වර්ෂයෙන් පසු සියලු තොරතුරු වර්ෂය තුළදීම ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව තුලනය කරන බැවින් මේ වන විට ගිණුම තුළ පවතින්නේ පැරණි ණය ශේෂයන් වන අතර එම ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහාද අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.<br><br>පළාත් සභා ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා රෝහල් සහ ආයතනවලින් තොරතුරු ගෙන්වා ගැනීමෙන් අනතුරුව අදාළ පළාත් වෙත දැනුම් දීමෙන් අනතුරුව එම ආයතනවලින්ද තොරතුරු කැඳවා ණය ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | | මියගිය, වැඩතහනම් වූ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව ලබා දී ඇත.<br><br>මියගිය, වැඩතහනම් වූ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ තවදුරටත් අයනොවන, ශේෂයන් අයකරගැනීමට සියලු උත්සහයන් දැරූ නමුත් අයකර ගත නොහැකි ණය ශේෂයන් පොතෙන් කපාහැරීම සඳහා ආකෘතින් පත්‍ර හඳුන්වා දී තොරතුරු රැස්කර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඒ අනුව ලද උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.<br><br>විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ලිපිගොනු කඩිනමින් සකස් කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන ණය ශේෂයන් නිරවුල් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.<br><br>අත්තිකාරම් ගිණුමට අදාළව පවතින දීර්ඝ කාලීන ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් සජීවීව සහ Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පවත්වා උපදෙස් ලබා දී ඇත.<br><br>අත්තිකාරම් 'බී' ගිණුමට අදාළව පවතින දීර්ඝ කාලීන ණය ශේෂ අය කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචනය කිරීමට කටයුතු කර ඇත.<br><br>විගණන විමසුම් හරහා නිරීක්ෂිත කරුණු නිවැරදි කරවීමට කටයුතු කරවීම හා ඇතැම් කරුණු විගණනයන්හිදී පරීක්ෂා කරන මෙන් අභ්‍යන්තර විගණක දැනුවත් කිරීම.<br><br>අත්තිකාරම් 'බී' ගිණුම සය මාසිකව තුලනය කිරීම.<br><br>තවද වර්ෂයට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 14 | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු සිදු කරන ලෙසට අදාළ රෝහල් හා සෞඛ්‍ය ආයතන වෙත ලබා දී තිබූ උපදෙස් පරිදි එකී තැන්පතු නිරවුල් කර ඇත. තව ද මු.රෙ. 571 ප්‍රකාරව නිරවුල් කර නොමැති තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |
| 15 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිමකාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම. මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | තත්ත්කාර්ය අතුරු අග්‍රිමකාර්ය නිම වී දින 10ක් තුල පියවීමට අවශ්‍ය උපදෙස් ලබා දීම, එසේ නොවන්නේ නම් නැවත අග්‍රිම ලබා නොදීමට කටයුතු කිරීම හා වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කිරීම වැනි අභ්‍යන්තර පාලන ක්‍රම මේ වන විට අනුගමනය කරමින් පවතී. තවද තත්කාර්ය අතුරු අග්‍රිම සීමාව ඉක්මවා නිකුත් කර නොමැත. |
| 16 | රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැරකර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් | පොදු තැන්පත් ගිණුම සම්බන්ධයෙන් ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා විවිධ අවස්ථාවලදී සියලුම විමධ්‍යගත රෝහල් සහ සෞඛ්‍ය ආයතන දැනුවත් කර ඇත. |

| | | |
|---|---|---|
| | ඇතුළත ආදායම් ගිණුමට බැරකර හෝ නොතිබීම. රැස්කළ ආදායම් අදාළ විධිවිධානවලට අනුකූලව ආපසු ගෙවා නොතිබීම | නිවැරදි විධිවිධාන අනුගමනය කරමින් ආදායම් බැර කිරීමට හා ආදායමෙන් ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී. මේ සම්බන්ධයෙන් නැවතත් සියලුම විමධ්‍යගත රෝහල් සහ සෞඛ්‍ය ආයතන දැනුවත් කර ඇත. |
| 17 | අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබීම. | අනුමත කාර්ය මණ්ඩලය නැවත සමාලෝචනය කර අදාළ සංශෝධනය කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් රෝහල් හා අනෙකුත් ආයතන වෙත ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන අදාළ සමාලෝචන කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. එලෙස අදාළ සමාලෝචනයෙන් පසු තවදුරටත් අතිරික්ත ලෙස හඳුනා ගන්නා නිලධාරීන් අදාළ ස්ථානවලින් ඌනතා ඇති ස්ථානවලට යොමු කිරීමට පියවර ගනු ලැබේ.<br><br>රෝහල් හා ආයතනවල අලුතින් වෛද්‍ය ඒකක ආරම්භ කිරීම හා රෝගී සත්කාර සේවාවන් පුළුල් වීම හේතුවෙන් ඇතැම් රෝහල් හා සෞඛ්‍ය ආයතනවල රෝගී සත්කාර සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුව ඇත. එබැවින් අනුමත හෙද කාර්යය මණ්ඩලය ඉක්මවා හෙද නිලධාරීන් අලුතින් ආරම්භ කළ ඒකකවල සේවය සඳහා යොදවා ඇත. එසේම මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශයේ සැලසුම් අංශ නිලධාරීන් විසින් කාර්යය මණ්ඩල අවශ්‍යතා වැඩිකර ගැනීමට ඉල්ලා ඇති සියලු රෝහල්වල ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කරමින් පවතී.ඒ අනුව ඉල්ලා ඇති හෙද නිලධාරී තනතුරු ලබාදීමේ කටයුතු ක්‍රමානුකූලව යාවත්කාලීන කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. එම කටයුතු අවසන් වූ පසු හෙද නිලධාරී අතිරික්තයක් නොමැතිව රෝහල් හා සෞඛ්‍ය ආයතන වල හෙද නිලධාරීන්ගේ සේවයේ යෙදවිය හැකිය |
| 18 | 2017.09.20 දිනැති අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර නොතිබීම. | අනුමත කාර්ය මණ්ඩලය නැවත සමාලෝචනය කර අදාළ සංශෝධනය කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් රෝහල් හා අනෙකුත් ආයතන වෙත ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන අදාළ සමාලෝචන කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.<br>තවද ලිපි මඟින් තොරතුරු රැස් කිරීමේ දී අදාළ ආයතනවලින් වන ප්‍රමාද වීම් හේතුවෙන් නිසි කලට ඇතැම් අවස්ථාවන්හිදී තොරතුරු යොමු කිරීම ප්‍රමාද වී තිබුණි.<br>මේ වන විට තොරතුරු රැස් කිරීමට මාර්ගගත ක්‍රමවේදයක් සකසා ඇත.<br>එමෙන්ම මාස තුනකට වරක් තොරතුරු යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත.<br>සෞඛ්‍ය අමාත්‍යාංශයීය වෙබ් අඩවිය පරිශීලනය කර තොරතුරු ලබාගත හැකි ක්‍රමවේදයක් ද මේ වන විට සකස් කර ඇත. |

දෙවැනි කොටස - 36.00

| අනු අංකය | කාරක සභාව හඳුනාගන්නා ලද දුර්වලතා | වගකිව යුතු නිලධාරී |
|---|---|---|
| 19 | ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබීම. | ඕනෑම ගැටලුවක් ඉදිරිපත් කිරීමට හා ඕනෑම තොරතුරක් දැනගැනීමට අමාත්‍යාංශය හා සම්බන්ධ විය හැකි info(at)health.gov.lk ඊ-මේල් ලිපිනය හා (94)112694033, (94) 112675011, (94) 112675449, (94)112693493 දුරකථන අංක අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කර ඇත.<br>ඊ-මේල් ලිපි නිරන්තරයෙන් පරීක්ෂා කරන අතර ඒ හරහා යොමුවන ගැටලු / විමසීම් අදාළ අංශ වෙත යොමු කෙරේ. ඒ අනුව අදාළ අංශ මඟින් පිළිතුරු ලබා දීම සිදු කරනු ලබයි. |
| 20 | 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥාප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම. | අමාත්‍යාංශයේ සියලු අංශ වෙතින් දත්ත/තොරතුරු ලබාගෙන පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සිංහල භාෂාවෙන් වෙබ් අඩවියේ පලකිරීම සහ අමාත්‍යාංශය තුළ ඩිජිටල් තිරයක ප්‍රදර්ශනය කිරීම සිදුකර ඇත. තවද අර්ධ වාර්ෂිකව යාවත්කාලීන කිරීමට ද කටයුතු යොදා ඇත. |
| 21 | ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥාප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. | පැමිණිලි හා යෝජනා ලබා ගැනීමට අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.<br>උක්ත සඳහන් පරිදි පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය යාවත්කාලීන කර, රජයේ ගිණුම් කාරක සභාවේ කමිටුව මඟින් අධීක්ෂණය හා ඇගයීම සඳහා කටයුතු යොදා ඇත. |
| 22 | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබීම. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12ට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම | නව මානව සම්පත් ක්‍රියාකාරී සැලැස්ම (2026- 2035) පිළියෙල කිරීමේදී මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.<br>2026/35 සඳහා වූ නව මානව සම්පත් ක්‍රියාකාරී සැලැස්ම සඳහා මෙම යෝජනාව ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.<br>වාර්ෂිකව විශේෂඥ වෛද්‍ය නිලධාරී, වෛද්‍ය නිලධාරී, හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවන්ට අයත් තනතුරු (රේඛීය අමාත්‍යාංශය හා පළාත් රාජ්‍ය සේවයේ) සඳහා විදේශීය පුහුණුව ද, සේවාස්ථ පුහුණුව ද ඇතුළත්ව සමස්ථ පුහුණු සැලැස්මක් අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ අංශය මඟින් වාර්ෂිකව ක්‍රියාවට නැගේ. පළාත් සෞඛ්‍ය සේවාව මඟින් ද සේවස්ථ පුහුණුව සෞඛ්‍ය කාර්යය මණ්ඩල සඳහා සැලසේ.<br>එමෙන්ම සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2023 වර්ෂය |

| | | |
|---|---|---|
| | | සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 111-2-20-2401 වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 300 ක ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණි. (ඇමුණුම 01)<br>එහෙත් අදාළ වර්ෂයේදී රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන (ඇමුණුම 02) ලබා දීම හේතුවෙන් සැලසුම් කළ ප්‍රහුණු වැඩසටහන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය. |
| 23 | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම. මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම්කර නොතිබීම. | 2023 වර්ෂයේ සිට මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ අංශයේ ප්‍රධානී තනතුරු හිස්ව පැවතීම, මේ සඳහා බලපෑ ප්‍රධානතම කරුණ විය. සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ආකෘති 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව සකසා ඇත.<br><br>සියලු කාර්යය මණ්ඩලය සඳහා සංශෝධික කාර්ය සාධන ආකෘතිපත් භාවිතයෙන් අදාළ අංශ මඟින් කාර්යය මණ්ඩලවල කාර්යය සාධන ඇගයුමට ලක් කරනු ලබයි.<br><br>අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වන අතර, මානව සම්පත් සංවර්ධන ප්‍රධාන සැලැස්ම සැකසීම ද මෙම අංශය මඟින් සිදුකරයි. (HRM Master Plan – 2026 -2035)<br><br>මෙම තනතුර ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරකි. ඒ අනුව මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සුදුසු නිලධාරියෙකු හැකි ඉක්මනින් පත් කිරීමට කටයුතු කරනු ඇත. |
| 24 | සැලසුම්ගත ප්‍රහුණු අවස්ථාවලින් ලබා දී තිබූ ප්‍රහුණු අවස්ථා ප්‍රමාණය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතීම. | 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව 111-2-20-001-2401 යටතේ මිලියන 300 ක් ඉල්ලුම් කර ඇත. (ඇමුණුම 01) නමුත් එම වර්ෂයේ දී ඉහත වැය විෂය යටතේ ලබා දී ඇත්තේ රුපියල් මිලියන 50 ක් පමණි. (ඇමුණුම 02) එම ප්‍රතිපාදන සැලසුම් කළ ප්‍රහුණු වැඩසටහන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නොවීය. |
| 25 | අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ වීම. | අහිතකර විගණන මතයට හේතු වූ අදාළ කරුණු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |
| 26 | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම. රජයේ ගිණුම් පිළිබඳ කාර්ක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබීම. | නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශයන් සහ රෝහල් දැනුවත් කර ඇත.<br>තවද ඒ සම්බන්ධයෙන් අදාළ අංශ විටින් විට ද දැනුවත් කර ඇත. |

| | | |
|---|---|---|
| 27 | නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අයකිරීම් කර නොතිබීම. මු.රෙ. 119 ප්‍රකාරව අයකළ යුතු අධිභාර අයකර නොතිබීම. | හදිසි වැටලීම් අංශය හා විමර්ශන අංශය මඟින් සිදු කරන සිදුකෙරෙන පරීක්ෂණ මඟින් ලබා දෙනු ලබන නිර්දේශ මත අදාළ අයකිරීම් සිදු කෙරෙන අතර තවදුරටත් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවධානය යොමු කරමි. |
| 28 | උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබීම. | එක් සේවා ස්ථානයක සේවා කාලය වසර 05 ට වඩා වැඩි නිලධාරීන් වාරෂික ස්ථාන මාරු කමිටු පිහිටුවා ස්ථාන මාරු කිරීමට පියවර ගනු ලබන අතර අභ්‍යන්තර ස්ථාන මාරු අදියර කිහිපයක් යටතේ 2025.11.17 දින සිට ක්‍රියාත්මක වේ. |

වෛද්‍ය නලින්ද ජයතිස්ස
ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.